රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 369

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1987 මැයි මස 11 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
රාජ්‍ය සංස්ථා ප්‍රධානීන් වෙත.

රාජකාරියේ යෙදී සිටියදී ත්‍රස්තවාදීන් අතින් මරණයට පත්වී ඇති හෝ ත්‍රස්තවාදී ක්‍රියාවන් හේතුකොට ගෙන අතුරුදහන් වී ඇති/ නිලධාරීන්ගේ යැපෙන්නන්ට වැටුප්/ වන්දි ගෙවීම.

ත්‍රස්තවාදීන් අතින් මරණයට පත්වූ අනියම් හෝ තාවකාලික හෝ නිලධාරියෙකු එම සිද්ධියට භාජනය වූ දින සිට ස්ථිර විශ්‍රාම වැටුප් හිමි තත්ත්වයට පත්වූ නිලධාරියෙකු මෙන් සැළකිය යුතු අතර, ඔහුගේ සේවය කෙතරම් කෙටි වුවත් ඔහුට මරණ පාරිතෝෂික ගෙවිය යුතුය.

02. එවැනි ඉරණමකට භාජනය වූ අවිවාහක, සේවයේ ස්ථිර වූ නිලධාරියෙකු, වයස අවුරුදු 55 එළඹීමට තිබුණ තෙක් ඔහුගේ යැපෙන්නන්ට, ඔහුට ලබාගත හැකිවූ මාසික වැටුප සහ අතිකුත් දීමනා ගෙවිය යුතුය.

(යැපෙන්නන් කියන්නේ, ඔවුන්ගේ ආදායම කෙසේ වුවත්, දෙමව්පියන් හා, එම නිලධාරියා වයස අවුරුදු 55 එළඹීමට තිබුණ දිනයට පළමුව දෙමව්පියන් මියගොස් ඇත්නම් අවුරුදු 18 ට අඩු සහෝදරයන් හා රැකියාවක් නොමැති අවිවාහක සහෝදරියන්ය.)

03. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 296 යටතේ දී ඇති වන්දි ප්‍රමාණයන්, මෙම ඉරණමට භාජනවූ, අවිවාහක නිලධාරියෙකුගේ දෙමව්පියන්ට ඔවුන් ලබන ආදායම් සැළකිල්ලට නොගනිමින් ගෙවිය යුතුය.

04. මෙම වගකීම් ඉටුකිරීම සඳහා එක් එක් අමාත්‍යාංශය හෝ දෙපාර්තමේන්තුව හෝ මෙම කටයුත්තට ප්‍රමුඛත්වය දී ක්‍රියා කිරීම සඳහා 1987 සම්මත වැය ප්‍රතිපාදනයන්හි ඉතිරි කිරීම් ලබාගත යුතුය. භාණ්ඩාගාරයෙන් අමතර මුදල් ඉල්ලුම් නොකළ යුතුය.

05. මෙම ක්‍රමය 1987 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වේ.

Siriwardhana

ඩී.බී.අයි.පී.එස්.සිරිවර්ධන
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.